2008.08.08 දින පළකරන ලද අංක 1,561 දරන ගැසට් පත්‍රයේ III කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,562 - 2008 අගෝස්තු මස 08 වැනි සිකුරාදා - 2008.08.08**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 934 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 935 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 936 |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 941 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 945 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 948 |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 අගෝස්තු මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 අගෝස්තු මස 01 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

යොමු අංකය : එස්ආර්එස්/එෆ් 6651.

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**මෝල්ඩඩ් සොලිඩ් රබර් පෑඩ්ස් (Moulded Solid Rubber Pads) 190,000ක් සැපයීම**

01. ශ්‍රී ලංකා දුම්රිය සේවයට පහත විෂයන් මිලදී ගැනීම සඳහා කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන), සභාපති විසින් මිළ දිමනාපත් භාරගනු ලැබේ. එක් එක් විෂයයන් වෙන් වෙන් වශයෙන් ඇගයීම සහ ප්‍රධානය කිරීම සිදු කෙරේ.

| *විෂය* | *ප්‍රමාණය* | *විස්තරය* | *සැලසුම් අංකය* |
|---|---|---|---|
| 01 | 150,000 | මොල්ඩඩ් සොලිඩ් රබර් පෑඩ්ස් 80 Ibs රේල්පිලි කොන්ක්‍රීට් සිල්පර සඳහා (Moulded solid Rubber Pads for 80 Ibs Rail Section Concrete Sleepers) | 19882/A |
| 02 | 40,000 | මෝල්ඩඩ් සොලිඩ් රබර් පෑඩ්ස් 88 Ibs රේල්පිලි කොන්ක්‍රීට් සිල්පර සඳහා (Moulded solid Rubber Pads for 88 Ibs Rail Section Concrete Sleepers) | 19883/A |

02. 2008.08.29 දින ප. ව. 2.00 ට මිල දිමනාපත් භාර ගැනීම අවසන් වේ.

03. ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී කාර්යාලය වෙත ආපසු නොගෙවනු ලබන රු. 2,500 ක මුදලක් ගෙවා කොළඹ 10, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් 2008.08.26 දින ප. ව. 3.00 දක්වා ලබාගත හැකි ආකෘති පත්‍රවල මිල ගණන් ඉදිරිපත් කළ යුතු වේ.

04. 2008.08.29 ප. ව. 2.00 ට මිල දීමනාපත් භාර ගැනීම අවසන් වූ වහාම, ඒවා විවෘත කිරීම කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය මූලස්ථාන කාර්යාලයේ දී සිදු කරන අතර එම අවස්ථාවට මිල දීමනාකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට සහභාගි විය හැක.

05. මුද්‍රා තබන ලද මිල දීමනාපත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැක.

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය,<br>
දුම්රිය මූලස්ථාන කාර්යාලය,<br>
ඕල්කට් මාවත,<br>
කොළඹ 10.

06. කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී මිල දීමනාපත් නොමිලයේ පරීක්ෂා කළ හැක. වැඩි විස්තර සඳහා කොළඹ 10, ඕල්කට් මාවතේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී දුම්රිය ගබඩා අධිකාරී විමසන්න. දුරකථන අංක 2432044, 2436818.

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

08-316

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - බණ්ඩාරවෙල

අධිකරණය වෙත ඉදිරිපත් කරන රාජසන්තක කරන ලද භාණ්ඩ හා හිමිකම් නොපාන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බණ්ඩාරවෙල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු වලට අදාළව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොපාන ලද භාණ්ඩ 2008.08.23 වැනි දින පෙ. ව. 10.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙහි සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නකු වේ නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ණ අවසරය මත වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2කට කලින් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැණුන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු වේ.

05. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන භාණ්ඩ එවෙලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියළුම ගෙවීම් මුදලින් ගෙවිම් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිල දී ගන්නා සෑම අයෙකුම තම අනන්‍යතාවය තහවුරු කළ යුතුය.

ඒ. එම්. එන්. පී. අමරසිංහ,
මහෙස්ත්‍රාත්,
බණ්ඩාරවෙල.

2008 ජූලි මස 09 වැනි දින,
බණ්ඩාරවෙල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසියට නියමිත භාණ්ඩ ලැයිස්තුව

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | 87264 | සාදා නිමකළ තේක්ක අල්මාරි 03<br>සාදා නිමකළ සූරිය මාර පුටු සෙට් 01<br>සාදා නිමකළ ස්ටූල් 03<br>සාදා නිමකළ බුරුත ඇඳන් 01<br>සාදා නිමකළ තේක්ක කණ්නාඩි මේස 01<br>සාදා නිමකළ තේක්ක මේස 02 |
| 02. | 89542 | අඩක් නිමකළ පුටු සෙට් 01<br>අඩක් නිමකළ අල්මාරියක කොටස් 12<br>අඩක් නිමකළ ස්ටූල් 01<br>අඩක් නිමකළ ඇඳ විට්ටම් 02<br>අඩක් නිමකළ ඇඳ වියල් 02 |
| 03. | විවිධ | විවිධ නඩු වලට අයත් ජංගම ඉරුම් මේස සහ කොටස් |
| 04. | විවිධ | විවිධ නඩු වලට අයත් හිස් බූලි තොගයක් |
| 05. | විවිධ | විවිධ නඩු වලට අයත් ගැරුම් වට්ටි |
| 06. | විවිධ | විවිධ නඩු වලට අයත් හිස් බෝතල් තොගයක් |
| 07. | විවිධ | විවිධ නඩු වලට අයත් බැරල් තොගයක් |

08-309

## දිසා අධිකරණය හා මහෙස්ත්‍රාත් අධිකරණය -වාලච්චේන

අධිකරණයේ නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1. වාලච්චේන මහෙස්ත්‍රාත් අධිකරණයේ පැවරුණු නඩු වලින් අයිතිකරුවන් නොමැති රාජසන්තක කරන ලද පහත විස්තර සඳහන් භාණ්ඩ 2008.08.23 වැනි දින පෙ. ව. 9.00 සිට ප. ව. 4.00 දක්වා මෙම අධිකරණයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මෙම නඩු භාණ්ඩ සම්බන්ධයෙන් අයිතිය කියා සිටින යම් තැනැත්තෙකු වේ නම් ප්‍රසිද්ධ වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම තම අතියිය පිළිබඳ වූ ඉල්ලීම ඉදිරිපත් කළ යුතුය.

3. මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය ඇතිව වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට ප්‍රථම මහජනතාවට නඩු භාණ්ඩ පරික්ෂා කර බැලිය හැක.

4. අපේක්ෂිත මිල ඉල්ලීමක් ඉදිරිපත් නොවන ඕනෑම භාණ්ඩයක් වෙන්දේසියෙන් ඉවත් කිරිමට අධිකරණයට බලය ඇත.

5. භාණ්ඩ මිළ දී ගත් වහාම අදාළ මුදල ගෙවා අධිකරණ සංකීර්ණයෙන් ඉවත් කර ගත යුතුය. ගෙවීම සඳහා චෙක්පත් භාරගනු නොලැබේ.

6. නඩු භාණ්ඩ මිළ දී ගන්නා තම අනන්‍යතාව තහවුරු කිරිම සඳහා ජාතික හැදුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

එම්. ගනේෂරාජා මහතා,
අතිරේක දිසා විනිසුරු,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
වාලච්චේන.

| අනුක්‍රමික අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ පිළිබඳ විස්තර | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | AR/72/07 | යතුරු පැදිය<br>(Hero Honda CD Down)<br>චැසි අංකය 05 H 27 F 10814<br>යන්ත්‍ර අංකය 05H27E13104 | 01 |
| 02 | AR/73/07 | අත් ට්‍රැක්ටරය<br>චැසි අංකය 20000613<br>යන්ත්‍ර අංකය 1913488571 | 01 |
| 03. | AR/110/07 | පාපැදි<br>අංක : CC 03375 | 01 |
| 04. | AR/156/08 | පොරෝව | 01 |
| 05. | AR/156/08 | පිහිය | 01 |
| 06. | AR/179/08 | පිහිය | 01 |
| 07. | B/98/07 | පාපැදි<br>(කැඩී ඇත)<br>ALESSA DAMMAM | |
| 08. | B/98/07 | පාපැදි<br>(කැඩී ඇත)<br>අංක M 980241<br>පාපැදි | |
| 09. | B/98/07 | අංක නැති | 01 |
| 10. | 6982/07 | බන්ඩි කියත | 01 |

| අනුක්‍රමික අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ පිළිබඳ විස්තර | ප්‍රමාණය |
|---|---|---|---|
| 11. | 6986/ F/07 | බන්ඩ් කියත | 01 |
| 12. | 6987/ F/07 | බන්ඩ් කියත | 01 |
| 13. | 6988/ F/07 | බන්ඩ් කියත | 01 |
| 14. | 6989/ F/07 | බන්ඩ් කියත | 01 |
| 15. | 7012/ F/07 | බන්ඩ් කියත | 01 |
| 16. | 7014/ F/07 | බන්ඩ් කියත | 01 |
| 17. | 7015/ F/07 | බන්ඩ් කියත | 01 |
| 18. | 7016/ F/07 | බන්ඩ් කියත | 01 |
| 19. | 7021/ F/07 | බන්ඩ් කියත | 01 |
| 20. | 7315/ F/08 | පුටු සෙට් (කුෂන්) පලු වර්ගය | 01 |
| 21. | 7315/ F/08 | පුටු සෙට් (කුෂන්) පලු වර්ගය | 01 |
| 22. | 7397/ PC | දර | 1/2 මීටර් |
| 23. | 7566/ F/08 | බන්ඩ් කියත | 02 |
| 24. | 7566/ F/08 | පොරෝව | 02 |
| 25. | 779/PC | දර | 2 මීටර් |

08-271

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**2009 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම - බේරුවල ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසය**

1982.08.20 දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ 1983 වර්ෂය හා ඊට පසු කාල පරිච්ඡේදය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි වලටත් එම කාලය තුල දී වලංගුව පවත්නා සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහි ම බලපාන පොදු සුරාබදු කොන්දේසි වලට යටත්ව 2009 වර්ෂය තුළ රා සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිලදී ගැනීම සඳහා බේරුවල ප්‍රාදේශීය ලේකම් තැන වන ම විසින් 2008 අගෝස්තු 18 වැනි දින පෙ.ව. 10.30 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නිසි ආකෘති පත්‍රයේ සකස් විය යුතු අතර,

(අ) ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් මුදලක් තැන්පත් කොට ඒ සඳහා ලබා ගත් කුවිතාන්සියක් සහ,

(ආ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපල පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර් කරුවකුගේ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විදිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කෙරේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂයෙන් සැළකිලිමත් විය යුතුය.

i. ටෙන්ඩර් පත්‍ර මුළුමනින්ම සම්පූර්ණ කළ යුතුය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින්ද ලිවිය යුතුය.

ii. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පෝරම වල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන් යොදා තිබිය යුතුය.

iii. සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන හා දිනය යොදා සහතික කර තිබිය යුතුය.

මෙහි නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ව සම්පූර්ණ කරනු ලබන ටෙන්ඩර් පත්‍ර

(අ) ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර ලබා ගන්නා ප්‍රාදේශීය ලේකම් කාර්යාල කුවිතාන්සිය සහ,
(ආ) වත්කම් සහතිකයක්

සමග ලියුම් කවරයක බහා මුද්‍රා තැබූ ලියුම් කවරයෙහි වම් කෙලවර මුදුනේ තැබෑරුම් අංකය හා නම සඳහන් කර බේරුවල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් කිරීමට ප්‍රථම තැන්පත් කළ යුතුය.

එසේ නැතහොත් ටෙන්ඩර් භාර ගන්නා වේලාව ඉකුත් වීමට ප්‍රථමයෙන් බේරුවල ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

04. එසේ එක් රේන්දයක් වෙනුවෙන් භාර ගැනීමේ අවසන් කරන වේලාව පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇත. එකී වේලාවන්හි දී සියළුම ටෙන්ඩර්කරුවන් බේරුවල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. සාර්ථක ටෙන්ඩරයක් ඉදිරිපත් කල අය වරප්‍රසාද මිලදී ගත් තැනැත්තායි ප්‍රකාශ කරනු ලැබූ පසු එම දින පස්වරු 2.30 ට පෙර බේරුවල ප්‍රාදේශීය මහ ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් බේරුවල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ තැන්පත් කොට යටකී රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතුය. මෙම ගෙවීම් මුදලින් හෝ බැංකුවක් විසින් ගෙවීම් සඳහායි ලකුණු කර චෙක්පතකින් හෝ මහජන බැංකුවෙන් හෝ ආරක්ෂික චෙක්පත් නමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් හෝ විය යුතුය.

06. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකි වූ තැබෑරුම් රේන්ද නැවත විකිණීම 2008.10.02 වැනි දින පෙ.ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුයි.

07. වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැනගත හැකිය.

යූ. ඩී. සී. ජයලාල්,
ප්‍රාදේශීය ලේකම්,
බේරුවල.

2008 ක් වූ ජූලි මස 21 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

### *උපලේඛනය*

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම් විවෘත කරන වේලාව* | *තැබෑරුම් වසන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *නැවත විකුණන වේලාව* |
|---|---|---|---|---|---|---|---|
| 01. | බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | අළුත්ගම උපකාර්යාලයේ සීමාව තුල | පෙ.ව. 11.00 සහ ප. ව. 5.00 | ප.ව. 2.00 සහ රාත්‍රී 8.00 | 2000 | 2008 අගෝස්තු 18 වැනි දින පෙරවරු 10.30 දක්වා | 2008 ඔක්තෝබර් 02 වැනි දින පෙරවරු 10.30 දක්වා |

*සැලකිය යුතුයි :-* 2009 වර්ෂයට දැනට රා තැබෑරුම පිහිටා ඇති ස්ථානය ලබා දීමට සහතික වනු නොලැබේ. අළුත් ස්ථානයක තැබෑරුම් විවෘත කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් බේරුවල ප්‍රාදේශීය මහලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුය.

08-270

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම - 2009 වර්ෂය

බළන්ගොඩ අංක 01 - රා තැබෑරුම

2009 ජනවාරි මස 01 වැනිදා සිට 2009 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා කාලසීමාව තුළ මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ප්‍රදේශයන්හි පැසුණු රා සිල්ලරට විකිණීම පිණිස ටෙන්ඩර් කැඳවනු ලැබේ.

මෙහි පහත සඳහන් කොන්දේසිවලට අනුකූල විය යුතුය.

(i) 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසි අනුව ; හා
(ii) සුරාබදු නිවේදනයෙහි දැක්වෙන සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන කරුණු කොන්දේසි මාලාවට යටත්වය.

02. සෑම ටෙන්ඩරයක් වෙනුවෙන් ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ලංකා බැංකු ශාඛාවකින් මුදල් තැන්පත් කළ බවට ලදුපතක් ටෙන්ඩරයට අමුණා එවිය යුතුය. පෝරම ගාස්තුව රු. 1,500කි.

03. ලංකාවේ සෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලකින් ද, කොළඹ සුරාබදු කොමසාරිස් කාර්යාලයෙන් ද ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රයක ලියන ලද ටෙන්ඩර් පත්‍රය කවරයක බහා සීල් තබා වම් උඩ කෙළවරේ මුදුනේ කුමන තැබෑරුමක් සඳහා ඉදිරිපත් කරන ටෙන්ඩරයක් ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය. ටෙන්ඩර් වැසීමට නියමිත කාලය ඉකුත් වීමට කලින් ප්‍රාදේශිය ලේකම්, " ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බලංගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුයි.

04. සෑම ටෙන්ඩර්කරුවෙක් ම තමාගේ නමින් ම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

05. එක් අයෙකුට එක් තැබෑරුමක් සඳහා එක් ටෙන්ඩරයකට වඩා එවිය නොහැක. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට වැඩි අයවලුන් විසින් සාමූහිකව ටෙන්ඩර් ඉදිරිපත් කළ නොහැක.

06. ටෙන්ඩර් කරන මුදල ඉලක්කමෙන් හා අකුරෙන් දැන්විය යුතුය. ටෙන්ඩරයේ කරන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යොදා සහතික කළ යුතුය. සෑම ටෙන්ඩරයක්ම සාක්ෂිකරුවන් දෙදෙනෙකු විසින් ද අත්සන් කළ යුතුය. මේ අවශ්‍යතාවයන් අනුකූල නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කළහැකිය.

07. ජයග්‍රාහි ටෙන්ඩර්කරු මිල දී ගත් තැනැත්තා හැටියට ප්‍රකාශ කළ විගසින් රේන්දය විකිණීමේ කොන්දේසියට අත්සන් තබා බලංගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරන මුදල ඇප වශයෙන් තැන්පත් කළ යුතුය.

08. 2008.09.03 දින පෙරවරු 10.30 දක්වා ටෙන්ඩර්පත්‍ර භාර ගනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. සෑම ටෙන්ඩර්කරුවෙක් ම එහි නියමිත වේලාවට බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

09. 2008.09.03 දින ටෙන්ඩර් විකිණීම අසාර්ථක වුවහොත් 2008.10.21 වැනි දින පෙ. ව. 10.30 දක්වා නැවත විකිණීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

10. කිසිදු හේතුවක් නොදක්වා කිසියම් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම හෝ ස්වකීය අභිමතය පරිදි ප්‍රතික්ෂේප කිරීමේ බලය බලංගොඩ ප්‍රාදේශිය ලේකම් වෙත පැවරී ඇත.

11. 2009 වර්ෂය සඳහා දැනට තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ස්ථානය ලබාගත හැකි දැයි කිව නොහැක. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් අදාළ කොට්ඨාසය තුලින් ගොඩනැගිලි සොයා ගත යුතු අතර, එම ගොඩනැගිලි සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සොයා දීමට බලපත්‍ර අදිකාරි බැඳී නොමැති බැව් සැළකිය යුතුය.

12. වැඩි විස්තර බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා දැන ගත හැකිය.

නිමලසේන ගමගේ,
ප්‍රාදේශීය ලේකම්,
බලංගොඩ.

2008 ජූලි මස 23 වැනි දින,
බලංගොඩ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *තැබෑරුමේ නම සහ අංකය* | *කොට්ඨාසය* | *පිහිටි ස්ථානය* | *තැබෑරුම විවෘත කර තැබිය හැකි වේලාවන්* | *ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|
| අංක 1 බලංගොඩ රා තැබෑරුම | බලංගොඩ නගර සභා සීමාව | බලංගොඩ නගර සභා සීමාව තුළ | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා සහ ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 2008.09.03 පෙ. ව. 10.30 |

08-398

**2009 වර්ෂය සඳහා උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම**

2009 ජනවාරි මස 01 දා සිට 2009 දෙසැම්බර් මස 31 දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති රා තැබෑරුමේ පැහුනු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිලදී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට් පත්‍රයේ* සුරාබදු කොමසාරිස්වරයා විසින් පළකරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද දැනට පවත්නා සියළු සුරාබදු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත්ව 2008 අගෝස්තු මස 29 වැනි දින පෙ. ව. 10.30 දක්වා උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

02. රා රේන්ද මිලදී ගැනීමට ඉදිරිපත් වන අය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කොට මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නියම කොට ඇති ටෙන්ඩර් තැන්පත් මුදල ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සරප්ගෙන් ලත් මුදල් කුවිතාන්සියක්ද ඉහත දක්වා ඇති *ගැසට් නිවේදනයේ* වන රා විකිණීමේ කොන්දේසිවල දැක්වෙන පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද සහිතව කවරයක බහා එයට මුද්‍රා තබා එහි ඉහල වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරන තැබෑරුමේ අංකය සහ නම ද පැහැදිලිව ලියා උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය හැක.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරන සෑම වෙනස් වීමක් ම ටෙන්ඩර්කරුගේ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 2008 අගෝස්තු මස 29 වැනි දින පෙ. ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. කිසිම කරුණු දැක්වීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා යයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව සාර්ථක ටෙන්ඩර්කරු විසින් එසේ ප්‍රකාශකළ දින ප. ව. 2.00 ට පෙර උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ගෙවා විකුණුම් කොන්දේසි වලට අත්සන් කළ යුතුය.

07. 2009 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම ඇති ස්ථානය ලබා දීමට සහතික වනු නොලැබේ. දැනට රා තැබෑරුම පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල 2009 වර්ෂය සඳහා නොලැබෙන්නේ නම් ඒ වෙනුවට තෝරාගත් අලුත් ස්ථානයේ යෝග්‍යතාවය පිළිබඳ ටෙන්ඩර් ප්‍රධානය කළ දින සිට දින 30 ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම්ගෙන් අනුමැතිය ලබාගත යුතුය.

08. 2008 අගෝස්තු මස 29 වැනි දින රේන්ද විකිණීමේ ලා සතුටුදායක ඉල්ලීම් නොතිබුනහොත් 2008 ඔක්තෝබර් මස 16 වැනි දින පෙ. ව. 10.30 ට නැවත රේන්ද විකිණීම මේ ස්ථානයේ දී පවත්වනු ලැබේ.

09. වැඩි විස්තර අවශ්‍යනම් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

එච්. එල්. එස්. විජේසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
උඩුබද්දාව.

2008 ජූලි මස 22 වැනි දින,
උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

**උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත රා තැබෑරුම් - 2009 වර්ෂය**

| *අංකය හා නම* | *පත්තුව* | *තැබෑරුම් විවෘත කළ යුතු ප්‍රදේශය* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් වසන වේලාව හා දිනය* | *තැබෑරුම විවෘත කළ යුතු වේලාව* | *තැබෑරුම වැසිය යුතු වේලාව* |
|---|---|---|---|---|---|---|
| උඩුබද්දාව අංක 02 | කටුගම්පල හත්පත්තුව | උඩුබද්දාව ගමතුළ | 250 | 2008.08.29 පෙ. ව. 10.30 | පෙ. ව. 11.00 සහ ප. ව. 5.00 | ප. ව. 2.00 සහ ප. ව. 8.00 |

08-395

**2009 වර්ෂයට හම්බන්තොට දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම**

2009 ජනවාරි මස 01 වැනි දින සිට 2009 දෙසැම්බර් 31 දක්වා කාලය තුල පහත උපලේඛනයේ විස්තර සඳහන් රා තැබෑරුමේ පැසුනු රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පල කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසිවලට හා පොදුවේ සෑම සුරාබදු බලපත්‍රයක්ම වෙනුවෙන් දැනට බලපවත්නා හා ඉදිරියට බලපැවැත්විය හැකි කොන්දේසිවලට යටත්ව හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි අංක 01 රා දරන තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

02. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 5000 ක් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට තැන්පත් කර ලබා ගත් නියමිත පෝරමය ඉදිරිපත් කල යුතුය. තවද ටෙන්ඩර්කරු විසින් පහත සඳහන් ගැසට් නිවේදනයේ පරිදි වත්කම් සහිත සහතික ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපල පිහිටි ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගෙන ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතුයි.

03. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින් ඉදිරිපත් කල යුතුය. නියෝජිතයෙකු විසින් හෝ ලාංකික නොවූ හා 1982.08.20 දින අංක 207 දරන ගැසට් පත්‍රයේ පල කරන ලද 1982 වර්ෂයේ රා රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුසු වන්නන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගනු නොලැබේ.

04. මෙම තැබෑරුම වෙනුවෙන් එක් අයෙකු විසින් එක් ටෙන්ඩරයකට වඩා ඉදිරිපත් කල නොහැකි අතර, පස්දෙනෙකුට වඩා හවුල් වන ටෙන්ඩර් පත්‍ර ද ඉදිරිපත් කල නොහැක.

05. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම කවරයක බහා සීල් තබා කවරයේ වම් පස මුදුනේ 'හම්බන්තොට දිස්ත්‍රික්කයේ අංක 01 දරන රා තැබෑරුමේ රේන්ද සඳහා ටෙන්ඩර් - 2009' යනුවෙන් පැහැදිලි ලෙස සඳහන් කල යුතුය. ටෙන්ඩර් සහිත කවරය හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් 2008.08.15 වැනි දින පෙ.ව. 10.00 ඉකුත් වීමට පෙර ලැබෙන සේ ඉදිරිපත් කල යුතුය.ටෙන්ඩර් වසන වේලාවේදී සියළුම ටෙන්ඩර්කරුවන් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණ සිටිය යුතුයි.

06. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන් වූ විට රේන්දය විකිණීමේ කොන්දේසිවලට අත්සන් කර හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් වශයෙන් නියම කරනු ලබන මුදලක් ගෙවිය යුතුයි.

07.ටෙන්ඩර් පත්‍රයේ හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර හෝ නියමිත හේතුන් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත.

08. කිසියම් හේතුවක් නිසා ටෙන්ඩර් භාර ගැනීමට නියමිත 2008.08.15 වැනි දින අවලංගු කිරීමට සිදුවුවහොත් නැවත ටෙන්ඩර් භාර ගන්නා දිනය 2008.09.30 වන දින වේ.

09. වැඩි විස්තර හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දැන ගත හැකිය.

ගනේෂ අමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
හම්බන්තොට.

2008 ජූලි මස 16 වන දින,
හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**2009 වර්ෂයට හම්බන්තොට දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද රා තැබෑරුම**

| *අනුක්‍රමික* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර්පත් භාර ගැනීම* | *තැබෑරුම විවෘතව තැබිය යුතුවේලාවන්* |
|---|---|---|---|---|
| 01 | හම්බන්තොට | හම්බන්තොට | 2008.08.15<br>පෙ.ව. 10.00 | පෙ.ව. 11.00 සිට<br>ප.ව. 2.00 දක්වා සහ<br>ප.ව. 5.00 සිට<br>ප.ව. 8.00 දක්වා |

08-237

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ, 09 වගන්තිය ප්‍රකාර දැන්වීමයි

සමාගමේ නම : අයි. සී. පී. එස්. හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 64291
සමාගමේ ලිපිනය : අංක 319 ඒ, මුල්ලේරියාව උතුර, අඹතලේ.

සමාගම් ලේකම්.

08-393

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයික්කාල, උතුරු කම්මල, " රෝස් විලා "හි පදිංචි වර්ණකුලසූරිය ජසින්තා මේබල් කුරේරා වන මම සම්පත් මධුගංගා කැටවලගෙදර ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2007.04.03 වැනි දින ලියා සහතික කළ අංක 754 දරන ඇටෝර්නි බලපත්‍රයෙන් දංකොටුව, උතුරු ගෝනවිල හි පදිංචි වර්ණකුලසූරිය ඇන්ටනි සිසිර නිමේෂියස් තිසේරා හට දෙන ලද ඇටෝර්නි බලය අවලංගු කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ඩබ්. ජේ. එම්. කුරේරා.

08-394

---

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලද බව මෙයින් දන්වමි.

1. සමාගමේ නම : කදුරට සමාජ හා ආර්ථික සංවර්ධන කේන්ද්‍රය
2. සමාගමේ ලියාපදිංචි අංකය : ජී. ඒ. 2072
3. සංස්ථාගත කළ දිනය : 2008 පෙබරවාරි මස 07
4. ලියාපදිංචි ලිපිනය : අංක 541, අලුත්වත්ත, රජවැල්ල.

නීතිඥ සරත් විජේරත්න,
සමාගමේ ලේකම්.

08-408

---

### දැන්වීමයි

2007 අංක 07 සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය යටතේ පහත සඳහන් සමාගම 2008.06.20 දින ලියාපදිංචි කර ඇත.

සමාගමේ නම පැරණි නාමය : පර්ෆෙක්සන් ඉන්ටර්නැෂනල් ලිමිටඩ්
ලියාපදිංචි අංකය : එෆ්. සී 1033
ලියාපදිංචි ලිපිනය : පර්ෆෙක්සන් ඉන්ටර්නැෂනල් ලිමිටඩ් අංක 66/9, රූබන් පෙරේරා මාවත, බොරලැස්ගමුව.

බිස්නස්මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 45, බ්‍රේබෲක් වීදිය, කොළඹ 02.

08-403

---

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : අල් - ජිලානි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් ලියාපදිංචි අංකය හා දිනය : පී. වී. 64436, 2008.06.12
ලියාපදිංචි ලිපිනය : 6 ඒ, තුන්වන හරස් වීදිය, කොළඹ 11

කන්සල්ටන්ස් ඇන්ඩ් කෝපරේට් සෙකට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන : අංක 2689618

08-296/3

---

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : උදාර ලංකා ඉන්ස්ටිටියුට් ෆෝ ඕගනික් ඇන්ඩ් සස්ටේනබල් ඇග්‍රිකල්චර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. වී. 64380, 2008.06.09
ලියාපදිංචි ලිපිනය : අංක 80, කුරුප්පු පාර, කොළඹ 08

කන්සල්ටන්ස් ඇන්ඩ් කෝපරේට් සෙකට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංක: 2689618

08-296/2

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : ඕෂන් වේව්ස් ෂිපං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. වී. 64758, 2008.07.09
ලියාපදිංචි ලිපිනය : අංක 8/4/7, බ්‍රිස්ටල් වීදිය, කොළඹ 01

කන්සල්ටන්ස් ඇන්ඩ් කෝපරේට් සෙකට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංක : 2689618

08-296/1

**සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියේ (1) උප වගන්තියට අනුව ඒ ඒ අදාළ සමාගම් සංස්ථාගත කරනු ලැබ ඇති බවට පහත සඳහන් සමාගම් විසින් මෙම ප්‍රසිද්ධ දැන්වීම ප්‍රකාශයට පත් කරනු ලැබේ

**ෆ්‍රෙෂ්වේ බේකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

සමාගම් අංක පී. වී. 64499 යටතේ, 2008 ජුනි මස 17 වැනි දා සංස්ථාගත කරනු ලැබූ අතර එහි ලියාපදිංචි කාර්යාලය, අංක 525, කෙලින් වීදිය, පුවක්පිටිය, අවිස්සාවේල්ල වේ.

08-255/1

**සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියේ (1) උප වගන්තියට අනුව ඒ ඒ අදාළ සමාගම් සංස්ථාගත කරනු ලැබ ඇති බවට පහත සඳහන් සමාගම් විසින් මෙම ප්‍රසිද්ධ දැන්වීම ප්‍රකාශයට පත් කරනු ලැබේ

**සෙන් - සාල් බේකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

සමාගම් අංක පී. වී. 64519 යටතේ, 2008 ජුනි මස 19 වැනි දා සංස්ථාගත කරනු ලැබූ අතර එහි ලියාපදිංචි කාර්යාලය, අංක 267, කඩුවෙල පාර, බත්තරමුල්ල වේ.

08-255/2

**සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියේ (1) උප වගන්තියට අනුව ඒ ඒ අදාළ සමාගම් සංස්ථාගත කරනු ලැබ ඇති බවට පහත සඳහන් සමාගම් විසින් මෙම ප්‍රසිද්ධ දැන්වීම ප්‍රකාශයට පත් කරනු ලැබේ

**රූෆල්ස් කේටරින් (ප්‍රයිවට්) ලිමිටඩ්**

සමාගම් අංක පී. වී. 64205 යටතේ, 2008 ජුනි මස 10 වැනි දා සංස්ථාගත කරනු ලැබූ අතර එහි ලියාපදිංචි කාර්යාලය, අංක 35, බගතලේ පාර, කොළඹ 03 වේ.

08-255/3

**සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියේ (1) උප වගන්තියට අනුව ඒ ඒ අදාළ සමාගම් සංස්ථාගත කරනු ලැබ ඇති බවට පහත සඳහන් සමාගම් විසින් මෙම ප්‍රසිද්ධ දැන්වීම ප්‍රකාශයට පත් කරනු ලැබේ

**එල්. එස්. අයි. ග්‍රීන් එනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ්**

සමාගම් අංක පී. වී. 64304 යටතේ, 2008 ජුනි මස 02 වැනි දා සංස්ථාගත කරනු ලැබූ අතර එහි ලියාපදිංචි කාර්යාලය, අංක 18, නාවල පාර, නුගේගොඩ වේ.

08-255/4

**සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියේ (1) උප වගන්තියට අනුව ඒ ඒ අදාළ සමාගම් සංස්ථාගත කරනු ලැබ ඇති බවට පහත සඳහන් සමාගම් විසින් මෙම ප්‍රසිද්ධ දැන්වීම ප්‍රකාශයට පත් කරනු ලැබේ

**පොලාරිස් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

සමාගම් අංක පී. වී. 64128 යටතේ, 2008 මැයි මස 16 වැනි දා සංස්ථාගත කරනු ලැබූ අතර එහි ලියාපදිංචි කාර්යාලය, අංක 88, ලෙවල් 03, විනිසුරු අක්බාර් මාවත, කොළඹ 02 වේ.

08-255/5

**සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියේ (1) උප වගන්තියට අනුව ඒ ඒ අදාළ සමාගම් සංස්ථාගත කරනු ලැබ ඇති බවට පහත සඳහන් සමාගම් විසින් මෙම ප්‍රසිද්ධ දැන්වීම ප්‍රකාශයට පත් කරනු ලැබේ.

චේම්බර් ඔෆ් චාටඩ් ජාවා ප්‍රොෆෙෂනල්ස්,

සමාගම් අංක ජී. ඒ. 2105 යටතේ, 2008 මැයි මස 07 වැනි දා සංස්ථාගත කරනු ලැබූ අතර එහි ලියාපදිංචි කාර්යාලය, අංක 3 බී, 1/4, හැව්ලොක් පාර, කොළඹ 5 වේ.

08-255/6

---

**සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියේ (1) උප වගන්තියට අනුව ඒ ඒ අදාළ සමාගම් සංස්ථාගත කරනු ලැබ ඇති බවට පහත සඳහන් සමාගම් විසින් මෙම ප්‍රසිද්ධ දැන්වීම ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ප්‍රයිම් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම් අංක පී. වී. 63822 යටතේ, 2008 අප්‍රේල් මස 11 වැනි දා සංස්ථාගත කරනු ලැබූ අතර එහි ලියාපදිංචි කාර්යාලය, අංක 75, ඩී. එස්. සේනානායක මාවත, කොළඹ 08 වේ.

08-255/7

---

**සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියේ (1) උප වගන්තියට අනුව ඒ ඒ අදාළ සමාගම් සංස්ථාගත කරනු ලැබ ඇති බවට පහත සඳහන් සමාගම් විසින් මෙම ප්‍රසිද්ධ දැන්වීම ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වෙඩින් රින්ග් ජෙම් ඇන්ඩ් ජුවෙලරි (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම් අංක පී. වී. 63728 යටතේ, 2008 අප්‍රේල් මස 08 වැනි දා සංස්ථාගත කරනු ලැබූ අතර එහි ලියාපදිංචි කාර්යාලය, අංක 23, පැරකුම්බා වීදිය, කුරුණෑගල වේ.

08-255/8

**සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියේ (1) උප වගන්තියට අනුව ඒ ඒ අදාළ සමාගම් සංස්ථාගත කරනු ලැබ ඇති බවට පහත සඳහන් සමාගම් විසින් මෙම ප්‍රසිද්ධ දැන්වීම ප්‍රකාශයට පත් කරනු ලැබේ.

3 එස් ප්‍රින්ට් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම් අංක පී. වී. 63483 යටතේ, 2008 මාර්තු මස 17 වැනි දා සංස්ථාගත කරනු ලැබූ අතර එහි ලියාපදිංචි කාර්යාලය, 635/6, මැද මන්ඩිය, පනාගොඩ, හෝමාගම වේ.

08-255/9

---

**ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම ලියාපදිංචි කරන ලදී

සමාගමේ නම : සියපත ඉංජිනියරිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී. වී. 64588
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 62/17 බී, බෝධිය පාර, මිරිහාන, නුගේගොඩ.

සමාගම් ලේකම්.

08-318

---

**දැන්වීමයි**

2008 ජුනි 10 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : වී. එන්. ටී. පියෝ පයින් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 64394
ලියාපදිංචි කාර්යාලය : අංක 66/12, ධම්මලංකාර මාවත, හිල් වීදිය, දෙහිවල.

ආර්. සෙන්දිල්කුමරන්,
ලේකම්.

08-257

---

**දැන්වීමයි**

2008 ජුනි 13 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : මාර්ෂා සිස්ටම්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 64444
ලියාපදිංචි කාර්යාලය : අංක 74, කැන්නාකිට්ම් පාර, යාපනය

ආර්. සෙන්දිල්කුමරන්,
ලේකම්.

08-259

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : නෙක්ස්ට්හෝම්ස් ලිමිටඩ්
සමාගමේ අංකය : පී. බී. 3539
ලියාපදිංචි ලිපිනය : අංක 165, කිංසි පාර, කොළඹ 00800
සංස්ථාගත කළ දිනය : 2008 ජුනි 04 වැනි දින

නෙක්ස්ට්හෝම්ස් ලිමිටඩ්,
අධ්‍යක්ෂ.

2008 ජූලි මස 3 වැනි දින.

08-300

### දැන්වීමයි

2008 ජූලි 11 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : එකෝලොජිටල් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 64529
ලියාපදිංචි කාර්යාලය : අංක 05, වාලුකාරාම පාර, කොළඹ 03

ආර්. සෙන්දිල්කුමරන්,
ලේකම්.

08-258

### දැන්වීම

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ පහත සඳහන් සමාගම 2008.06.25 දින ලියාපදිංචි කර ඇත

සමාගමේ නම : ඊ ඇන්ඩ් එල් ප්‍රොපර්ටි ඩිවලොපර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වි. 64590
ලියාපදිංචි ලිපිනය : ඊ ඇන්ඩ් එල් ප්‍රොපර්ටි ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අංක 50/2, පෙරේරා ඇවනියු, එස්. ද එස්. ජයසිංහ මාවත, නුගේගොඩ

බිස්නස්මේට් (ප්‍රයිවෙට්) ලිමටඩ්,
ලේකම්වරු.

අංක 45, බ්‍රේබෲක් වීදිය, කොළඹ 02.

08-260

### දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ දැන්වීමයි

ලියාපදිංචි කළ දිනය : 2008.07.08
සමාගමේ නම : ටොප් වර්ල්ඩ් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 64750
ලියාපදිංචි කාර්යාලය : අංක 403, 1/1, ගාලු පාර, කොළඹ 06

ටොප් වර්ල්ඩ් (පුද්ගලික) සමාගම.
අධ්‍යක්ෂ,

08-261

### දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ දැන්වීමයි

ලියාපදිංචි කළ දිනය : 2008.07.08
සමාගමේ නම : සෙඩ්ජ් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 63435
ලියාපදිංචි කාර්යාලය : අංක 143, දුටුගැමුණු පාර, කොහුවල, නුගේගොඩ.

අධ්‍යක්ෂ,
සෙඩ්ජ් (පුද්ගලික) සමාගම.

08-262

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මාතලේ, නාගොල්ල පාරේ, අංක 40/7, දරන ස්ථානයේ පදිංචි සිසිල් දිසානායක වන මම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ජේ. එම්. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන්නට යෙදුණ අංක 300 සහ 1998.03.29 දින දරන ඇටෝර්නි බලපත්‍රයෙන් මොරටුව, මොරටුමුල්ල නැගෙනහිර, අංක 16 දරන ස්ථානයේ පදිංචි බලාපුවඩුගේ මලිත් රන්සිරි මෙන්ඩිස් නැමැති අයට දෙන ලද බලය මෙතැන් සිට අවලංගු කර බල රහිත කර දමන බව සියලු දෙනාටම දන්වා සිටිමි.

සිසිල් දිසානායක.

08-264

**සීමිත සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ පොදු නිවේදනය**

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ අංක 9 ජේදය ප්‍රකාරව සවුත් ඒසියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම, වර්ෂ 2008 ජුනි මස 08 දින සිට සංස්ථාගත කරන ලද බව මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ නම : සවුත් ඒසියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 64641
ලියාපදිංචි කාර්යාලය : අංක 147/2, සේනානායක මාවත, 2 වන පටුමග, නාවල
සංස්ථාගත කරන ලද දිනය : 2008 ජුනි මස 08 වැනි දින.

එච්. එස්. තෙන්නකෝන්,
සමාගමේ ලේකම්.

08-366

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැන්වීම

සමාගමේ නම : ඔටෝ බැක්ස් එයිට් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : පී. වී. 64597
ලියාපදිංචි ලිපිනය : අංක 123, අනියාකන්ද පාර, වැලිසර, රාගම

ලේකම්.

2008 ජුලි මස 24 වැනි දින.

08-368

# රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා අයදුම්පත්

**නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2009 වර්ෂයේ විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම**

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළකර ඇති 1983 වර්ෂයට සහ ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී බලපවත්නා සෑම සුරාබදු කොන්දේසිවලටත් 2009 වර්ෂයේ දී පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන විදේශ මත්පැන් (ධාන්‍ය වලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් විසින් 2008.09.04 වැනි දින පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන වේලාව දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. (අ) සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමයක් විය යුතුය.

(ආ) ඇප මුදලක් වශයෙන් දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට පහත උපලේඛනයේ දැක්වෙන ආකාර ටෙන්ඩර් මුදලක් තැන්පත් කර ලබා ගන්නා නිල කුවිතාන්සියක් සහ,

(ඇ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් සහ වත්කම් පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථෝක්ත විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කරනු ලැබේ.

(ඈ) ටෙන්ඩර් පත්‍රය සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැලකිලිමත් විය යුතුය.

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින් ම සම්පූර්ණ කළ යුතුය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කරන ගණන් ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතුය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රවල නියමිත සාක්ෂි කරුවන්ගේ අත්සන්වලට අමතරව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංකය ද යෙදිය යුතුය.

(iii) සෑම වෙනස් කිරීමක්ම/කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතුය.

(iv) සෑම සාර්ථක ටෙන්ඩර් කරුවෙක් ම ටෙන්ඩර් පෝර්ම සමග තම ජාතික හැඳුනුම්පත ද ඉදිරිපත් කළ යුතුය.

*මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා ලද නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකයක් සමග ලියුම් කවරයක බහා සීල් තබා කවරයේ වම් කෙළවර මුදුනේ නියමිත තැබෑරුම් අංකය හා නම් සඳහන් කර නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතුය.

ටෙන්ඩර්පත් තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත සඳහන් උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම එදින ප. ව. 2.00ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන වාරික තුනකට නොඅඩු මුදල නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතුය. මෙම මුදල මා නමින් නුවරඑළිය ලංකා බැංකුවේ වාර්ෂික ස්ථිර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතුය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුව විසින් ගෙවීම සඳහා යන්න සටහන් කරන ලද චෙක්පතකින් ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතුය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවකට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතුය.

07. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය.

08. කිසියම් ටෙන්ඩරයක් කීප දෙනෙකු හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතුයි.

09. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් 2008.10.22 වැනි දින පෙ. ව. 10.30 ට මෙම ස්ථානයේදී ම නැවත විකුණනු ලැබේ.

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මගේ තීරණය අවසාන තීරණය වේ.

11. රේන්ද විකිණීම හා අදාල කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර සඳහා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසීම් කළ යුතුය.

ගාමිණී ඉලංගරත්න,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2008 ජුලි මස 21 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

### *උපලේඛනය*

### *විදේශ මත්පැන් තැබෑරුම්*

| *අංකය හා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය* | *ටෙන්ඩර් භාර ගන්නා දිනය* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල* |
|---|---|---|---|---|
| අංක 01-නුවරඑළිය | නුවරඑළිය මහ නගර සභා අංක 06 කොට්ඨාසය තුළ | 2008.09.04 | පෙ. ව. 10.30 | රු. 5,000 |

08-353

---

### කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

2009 වර්ෂය සඳහා රා සහ විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළකර ඇති 1983 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබෑරුම් හා විදේශීය මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන බීම වර්ග ඇතුළුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී පවත්නා සෑම සුරාබදු කොන්දේසිවලටත් යටත්ව, 2009 වර්ෂය තුළ දී පහත සඳහන් උපලේඛනයන් හි දැක්වෙන රා තැබෑරුම්වල සහ විදේශීය මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිළ දී ගැනීම සඳහා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් 2008.09.05 දින පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන වේලාව දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. (අ) සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝර්මයේ විය යුතුය.

(ආ) ටෙන්ඩර් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත උපලේඛනයේ දැක්වෙන ආකාර ටෙන්ඩර් මුදලක් තැන්පත් කර ලබා ගන්නා නිල කුවිතාන්සියක් සහ

(ඇ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් සහ වත්කම් පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථොක්ත රා තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල සහ විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

(ඈ) ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවන් කෙරෙහි ද සැළකිලිමත් විය යුතුය :

(i) ටෙන්ඩර්පත්‍ර මුළුමනින් ම සම්පූර්ණ කළ යුතුය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කෙරෙන ගණන් ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතුය ;

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන් වලට අමතරව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංක ද යෙදිය යුතුය ;

(iii) සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතුය.

(iv) සෑම සාර්ථක ටෙන්ඩර්කරුවෙකු ම ටෙන්ඩර් පෝර්මය සමග තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය. මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබාගන්නා ලද නිල කුවිතාන්සියත්, වත්කම් පිළිබඳ සහතිකයත් සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම්පස ඉහළ කෙළවරේ නියමිත තැබෑරුම් අංකය සහ නම සඳහන් කර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ, ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතුය. ටෙන්ඩර්පත්‍රය තැපෑලෙන් එවන්නේ නම්, ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත්වීමට පෙර "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොත්මලේ' "යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි සීඝ්‍රගාමී තැපෑලෙන් එවිය යුතුය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත සඳහන් උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු, ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත්කළ වහාම එදින ප. ව. 2.00ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතුය. එම මුලු මුදල මා නමින් පූණ්ඩලූඔය මහජන බැංකුවේ වර්ෂයක ස්ථිර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතුය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුවක් විසින් ගෙවීම සඳහා ද යන්න සඳහන් කරන ලද චෙක්පතකින් හෝ, ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් "ආරක්ෂිත චෙක්පත් " ස්වරූපයෙන් ගෙවිය යුතුය.

අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතුය.

07. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

08. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු විසින් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම්, ඒ එක් එක් අයගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙන ම පැහැදිලිව දැක්විය යුතුය.

09. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත්, ඒවා 2008.10.23 වැනි දින පෙ. ව. 10.30ට මෙම ස්ථානයේ දී ම නැවත විකුණනු ලැබේ.

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

11. රේන්ද විකිණීම හා අදාල කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා ලබාගත හැකිය.

ජානක ධර්මකීර්ති,
ප්‍රාදේශීය ලේකම්,
කොත්මලේ.

2008 ජූලි මස 21 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අංකය හා රා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටිය යුතු ස්ථානය* | *ටෙන්ඩර් භාරගැනීම අවසන් වන වේලාව* | *ටෙන්ඩර් ඇප තැන්පත් මුදල රු.* |
|---|---|---|---|
| අංක 1 කඩදොරපිටිය | කඩදොරපිටිය ග්‍රාමය තුළ | 2008.09.05 පෙ. ව. 10.30 | 1,000 |
| අංක 2 ඕතලාව | තෝරාගනු ලබන ස්ථානයට කොත්මලේ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගත් ලිපියක් ඉදිරිපත් කළ යුතුය. | 2008.09.05 පෙ. ව. 10.30 | 1,000 |
| අංක 3 කටුකිතුල | කටුකිතුල ග්‍රාමය තුළ | 2008.09.05 පෙ. ව. 10.30 | 1,000 |
| අංක 2 විදේශ මත්පැන් තැබෑරුම පුණ්ඩලුඔය | පුණ්ඩළුඔය නගරය ඉහළ කඩ වීදිය | 2008.09.05 පෙ. ව. 10.30 | 3,000 |

08-324

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - කුලියාපිටිය ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට, වගාවට සුදුසු ඉතා වටිනා දේපලක් කුලියාපිටිය-කටුගම්පොල හත් පත්තුවේ බටහිර මැදපත්තු කෝරළේ බම්මන්න ගමේ පිහිටි ඇල්හේනේපිටියහේන සහ ඇල්හේනේපිටිය නමැති ඉඩමට බලයලත් මානක බී. ඒ. එස්. ෆිගුරාඩෝ විසින් 1973.10.09 දින අංක 2211 දරන පිඹුරේ සඳහන් බෙදා වෙන් කළ කොටසක් හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ. ප්‍රමාණය : අක්. 01 රූඩ් 01

මෙම දේපල, අහමඩ් හසන් මොහොමඩ් අලාවි ණයකරු වශයෙන්, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. කලින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*ඉඩමට පිවිසීම.* - කුලියාපිටිය නගර මධ්‍යයේ සිට පන්නල මාර්ගයේ ඇලබඩගම දක්වා කි. මී. 13.5ක් පමණ ගමන් කර වම් දෙසට හැරී බම්මන්න පාරට පිවිස කි. මී. 3ක් පමණ බම්මන්න දක්වා ගමන් ගෙන දකුණට හැරී මීටර් 200ක් පමණ ගමන් කර මෙහිදී වමට හැරී ඉදිරියට මීටර් 150ක් පමණ ගමන් ගත් විට අදාල දේපල පිහිටා තිබේ.

2008ක් වූ සැප්තැම්බර් මස 04 වැනි දින පෙ. ව. 11.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2008.05.16 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2008.05.05 දින ද අයිලන්ඩ්, ලක්බිම සහ තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*— විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ.

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 , ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම්, දළ ගැණුම් මිළෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. දී හි ප්‍රධාන කාර්යාලයට හෝ කුලියාපිටිය ශාඛාව වෙත ගෙවා නිම කළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. කළමනාකරු, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අංක. 74, හෙට්ටිපොල පාර, කුලියාපිටිය.

දුරකථන අංක : 037-2281642/037-4696074 /037-4696075.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමලුව පාර,
වටපුළුව,
මහනුවර.
දුරකථන අංක : 081-2211025, 071-4755974,
ෆැක්ස් අංකය : 081- 2211025.

08-385/1

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී - මහනුවර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට/වගාවට සුදුසු ඉතා වටිනා දේපළක් මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාත කඳුකර පහළ කෝරළේ කළුගමුව ගමේ පිහිටි ඕල්ඩ්හල්ඔය එස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක එල්. බී. බැද්දෙවෙල විසින් සාදන ලද 1959.08.15 දින අංක 1012 දරන පිඹුරේ සඳහන් බෙදූ ලොට් 18බී දරන ඉඩම හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සියලු දේ. ප්‍රමාණය අක්කර 01.

මෙම දේපල, සිවප්‍රගාසම් ෂන්මුගනාදන් යන අය ණයකරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී. එල්. සී. වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*ඉඩමට පිවිසීම.* - මහනුවර සිට පේරාදෙණිය මාර්ගයේ ගමන් ගෙන ගලහ පාරට පිවිස කි. මී. 12ක් පමණ වාරියගල දක්වා (බොක්කු අංක 13/1 දක්වා) ගමන් ගෙන දකුණු දෙසින් පිහිටි ඕල්ඩ්හල්ඔය එස්ටේට් පාරට හැරී මීටර් 650ක් පමණ ගිය පසු අදාළ දේපළ පිහිටා තිබේ.

2008ක් වූ සැප්තැම්බර් මස 05 වැනි දින පෙ. ව. 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2008.06.27 වැනි දින *රජයේගැසට් පත්‍රය* ද 2008.06.19 දින ද අයිලන්ඩ්, ලක්බිම යන පුවත්පත් ද 2008.06.18 දින තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ.

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 , ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයට හෝ මහනුවර ශාඛාව වෙත ගෙවා නිම කළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. කළමනාකරු, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. කොටුගොඩැල්ල වීදිය, මහනුවර.

දුරකථන අංක : 081-2223217/081-2224392/081-2222504/081-2225749/1

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමලුව පාර,
වටපුළුව,
මහනුවර.
දුරකථන අංක : 018-2211025, 071-4755974,
ෆැක්ස් අංකය : 081- 2211025.

08-385/2

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මස්කෙළිය ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට සුදුසු දේපළක් නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරළේ අප්කොට් ගමේ පිහිටි බාග්‍රොව් ඩිවිෂන් හි ගව්රවිලා ග්‍රෲප් නමින් හඳුන්වන ඉඩමේ කොටසක් වන බලයලත් මානක ඉරන්දතිස්ස කොටඹගේ විසින් සාදන ලද අංක 7695 සහ 2004.07.27 වැනි දිනැති පිඹුරේ සඳහන් බෙදා වෙන් කරන ලද ලොට් 01 සහ 02 දරන ඒකාබද්ධ කැබලි දෙක සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි වැව්ලි ඇතුළු අනෙකුත් සියලු දේ .

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 25.15

මෙම දේපළ, සින්නතම්බි ඉයාවු කනගසබෙයි වේලු රාමයියා සහ පුත්ගොතෙයි කනගසබෙයි (කලින් රාමයියා) ණයකරුවන් හැටියට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*ඉඩමට පිවිසීම.*¨ මස්කෙළිය නගරයේ සිට අප්කොට් මාර්ගයේ කි. මී. 11ක් පමණ ගමන් ගත් විට මෙම දේපළ පාරේ දකුණු දෙසින් ප්‍රධාන මාර්ගයට මීටර් 75 ඔබ්බෙන් අප්කොට් කඩ වීදියට කි. මී. 01ක් නුදුරුව පිහිටා තිබේ.

2008ක් වූ අගෝස්තු මස 27 වැනි දින පෙ. ව. 11.00 ට එම දේපළ පිහිටි ස්තානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2008.05.23 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2008.06.17 දින ද අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ.

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 , ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවා නිම කල යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකරු (අයකිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661821, 011-2661815.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමලුව පාර,
වටපුළුව, මහනුවර.
දුරකථන අංක : 018-2211025, 071-4755974,
ෆැක්ස් අංකය : 081- 2211025.

08-385/3

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මහනුවර ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට සුදුසු දේපළක් මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ඒදඬුවාව ගමේ හොදිගමුවේ කුඹුරේවනාත හෙන්දිගමුවේ කුඹුර සහ හොදිගමුවේවත්ත නමැති ඉඩමට බලයලත් මානක කේ. බී. ලන්සකරනායක විසින් මැන සාදන ලද 1995.09.30 වැනි දින අංක 1216 දරන පිඹුරේ සඳහන් ලොට් 1 සහ ලොට් 2 දරන ඒකාබද්ධ ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 32 (ලොට් 1 පර්. 23.3, ලොට් 2 පර්. 8.7)

මෙම දේපළ, හපුපුරුගාල ගම්ලද්දලාගේ අනුර රණසිංහ සහ මානගේ චම්පිකා සිරිවර්ධන ණයකරුවන් හැටියට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*ඉඩමට පිවිසීම.* - මහනුවර නගර මධ්‍යයේ සිට කොළඹ ප්‍රධාන මාර්ගයේ කි. මී. 6.8ක් පමණ ගමන් ගත් විට මාර්ගයේ වම් දෙසින් අදාළ දේපළ ප්‍රධාන මාර්ගයට ඔබ්බෙන් පිහිටා තිබේ.

2008ක් වූ අගෝස්තු මස 29 වැනි දින ප. ව. 2.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2008.06.20 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2008.07.01 දින ද අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ.

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 , ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවා නිම කල යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකරු (අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661821, 011-2661815.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමලුව පාර,
වටපුළුව,
මහනුවර.

දුරකථන අංක : 018-2211025, 071-4755974,
ෆැක්ස් අංකය : 081- 2211025.

08-385/4

## සෙලාන් බැන්ක් පීඑල්සී - මහනුවර ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කුණ්ඩසාල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ගුන්නෑපාන පල්ලේගම්මැද්දේ පිහිටි මීගහකොටුව නමැති ඉඩමෙන් බෙදූ කොටසක් හා එහි තුළ පිහිටි නිවස ඇතුලු අනෙකුත් සියලු දේ. ප්‍රමාණය පර්චස් 32.5.

මෙම දේපළ, පොල්ගොල්ලේ අයි. ඒ. එම්. කන්ස්ට්‍රක්ෂන් යන නාමය විලාශය යටතේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන සුමිත් විජිත කුමාර ඇල්පිටිය යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*ඉඩමට පිවිසීම.* - මහනුවර සිට වත්තේගම පාරේ කි. මී. 7ක් පමණ උයන්වත්ත හන්දිය දක්වා පැමිණ දකුණු දෙසට පොල්ගොල්ල මහවැලි වේල්ල දෙසට මීටර් 300ක් පමණ ගමන් ගෙන වම් දෙසින් පිහිටි සිරිමල්වත්ත පාරට හැරී කි. මී. 1.60ක් පමණ ගුන්නෑපාන පල්ලේගම්මැද්ද දක්වා ගමන් ගත් විට අදාළ දේපළ පිහිටා තිබේ.

2008ක් වූ අගෝස්තු මස 28 වැනි දින ප. ව. 2.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2007.06.29 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2007.04.27 දින ද ඩේලිමිරර්, ලංකාදීප සහ 2007.05.10 දින වීරකේසරී යන පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ.

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශිය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 , ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී සෙලාන් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.

සහකාර සාමාන්‍යාධිකාරී (දේපළ අංශය),
සෙලාන් බැන්ක් පී. එල්.සී,
සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල,
අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-4701284, 011-2456285, 011-2456291, 011-2456284

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමලුව
පාර,වටපුළුව,
මහනුවර.
දුරකථන අංක : 081-2211025, 071-4755974,
ෆැක්ස් අංකය : 081- 2211025.

08-385/5

**ඩීඑෆ්සීසී බැංකුව**

(කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වැනි වගන්තිය යටතේ විකිණීම

**වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

අංක 20861 දරන ප්‍රාථමික ඇපකරය යටතේ සහ අංක 21514 දරන ද්විතියික ඇපකරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ. ගම්පහ දිස්ත්‍රික්කයෙහි, අලුත් කුරු කෝරළේ, දූනගහපත්තුවේ පිහිටි දිවුලපිටිය (කෙහෙල් ඇල්ල උපකාර්යාලය) ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත අකරගමෙහි පිහිටි බලයලත් මිනින්දෝරු එච්. ඩී. රූපසිංහ මහතා විසින් සකසන ලද 1999 අප්‍රේල් මස 26 වැනි දින දරන පිඹුරුපත් අංක 958 හි ලොට් අංක 2 ලෙස සඳහන් දෙල්ගහවත්ත ලෙසත් දෙල්ගහලන්ද ලෙසත් හැඳින්වෙන බෙදා වෙන් කරන ලද ඉඩම.

ඉඩමේ ප්‍රමාණය අක්. 0, රූඩ් 3, පර්. 18.0

එහි පිහිටි ගොඩනැගිලි ගස් වැල්, වැවිලි හා එහි අඩංගු සියල්ල ඇතුළත්ව ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්ලිව්. රාජකරුණා මහතා විසින් සහතික කරන ලද, 2003 අප්‍රේල් මස 29 වැනි දිනැති, අංක 20861 දරන උකස්කරය ප්‍රකාර සහ 2004 මාර්තු මස 22 දිනැති අංක 21514 දරන උකස්කරය ප්‍රකාර අකරගමෙහි 'ලක්මිණි බ්ලොක් ගල් ව්‍යාපාරය' සහ 'වෙස්ටර්න් උත්සව ශාලාව' යන නම්වලින් ව්‍යාපාර පවත්වාගෙන යන අකරගම පදිංචි ගාර්දි හේවාගමගේ බන්දුල පුෂ්පකුමාර යන අය විසින්, ඩීඑෆ්සීසී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ, ඩීඑෆ්සීසී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2008 අගෝස්තු මස 27 වැනි දින (බදාදා) පෙරවරු 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* මිල තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුලු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර),
4. රු. 31,106.25 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු අය බදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න.

දුරකථන අංක 011- 2442442.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම 150 9001 : 2000
සහතිකය ලත්, ශ්‍රී ලංකාවේ පිළිගත්,
පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කා්රයාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290 හැව්ලොක් පාර, .
කොළඹ 5,
දුරකථන අංක 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් schokman@samera1892.com

08-361

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී.—මහරගම ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එල්. ඒ. ඩී. ගුණතිලක විසින් හැටන් නැෂනල් බැන්ක් පී, එල්. සී. නමට ලියා සහතික කරන ලද්දා වූ 2003.10.10 දින සහ අංක 882 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඇස්ලි මිචෙල් ඇන්තනී ප්‍රනාන්දු ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2008 අගෝස්තු මස 27 වැනි දින පෙ.ව. 11.00 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභාවේ, දෙපානම ගමේ, දෙපානම පන්නිපිටිය විර මාවතේ, වරිපනම් අංක 190/22/එල් හි පිහිටි ගොඩැල්ල වත්ත සහ දොලේ කනත්ත නමැති ඉඩමෙන් බෙදා වෙන් කළ බලයලත් මානක එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් 2001.01.05 දින මැන සාදන ලද පිඹුරු අංක 2973 ලොට් 10 දරන ඉඩම් කොටස සහ ඉහත කී අංක 882 දරන බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ සඳහන් මාර්ග අයිතිය ද සමග වේ.

විශාලත්වය - පර්චස් 07 යි

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.1102 දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2007.11.16 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* — වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500) ක් ද,
5. සියලුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2000) ක් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය.

අදාළ ඔප්පු සහ අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ප්‍රධාන කළමනාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.

දුරකථන අංකය : 2863121

08-391/1

---

## සෙලාන් බැංකුව පීඑල්සී - මහනුවර ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර මහ නගර සභා සීමාව තුළ පෙර හල්ලෝලුව ගමේ ජෝර්ජ් ඊ. ද සිල්වා මාවතේ 1 වෙනි පටුමගේ පිහිටි දැන් වරිපනම් අංක 309/55, 309/55 ඒ සහ 309/56 දරන ක්‍රේග්වෙල් හවුස් පරිශ්‍රය නමැති (බලයලත් මිනින්දෝරු පී. ආර්. ක්ලාස් විසින් සාදන ලද 1942.10.13 දිනැති අංක 244 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 1 හි කොටසක් වන) හෝප් එස්ටේට් හි කොටසක් නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු බර්නාඩ් පී. රූපසිංහ විසින් සාදන ලද 1997.05.02 දිනැති අංක 2006 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන බෙදා වෙන් කරන ලද අංක 1 ලකුණු කල ඉඩම් කැබැල්ල ප්‍රමාණයෙන් අක්කරයක් (අ. 1, රූ. 0, පර්. 0) විශාල වරිපනම් අංක 309/55, 309/55 ඒ සහ 309/56 දරන ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියලු දේ සහ ප්‍රධාන පාරේ සිට නිවෙස්වලට යන පාරේ මාර්ග අයිතිය සමග ඉඩම.

මෙම දේපල මහනුවර තේජා ට්‍රේඩර්ස් හිමිකරු වශයෙන් ව්‍යාපාර පවත්වාගෙන යන අය හික්කඩුව ගමගේ තේජසිරි ගුණතිලක යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපල 2008 අගෝස්තු මස 29 වන දින පෙරවරු 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.*- නුවර සිට පේරාදෙණිය පාරේ කි. මී. 1 ක් ගිය විට හමුවන කටුකැලෙන් දකුණට ඇති ජෝර්ජ් ඊ. ඩී සිල්වා මාවතේ කි. මී. 1.5 ක් ඉදිරියට යන විට ඇති රොස්මන්ඩ් පෙදෙස පාර හංදියෙන් වමට ඇති ජෝර්ජ් ඊ. ඩී. සිල්වා මාවත, පළමුවන පටුමගේ මීටර් 300 ක් ගිය විට අදාල දේපල පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම *රජයේ ගැසට් පත්‍රයේ* 2002.10.11 වන දින පළ වී ඇති අතර සහ ඩේලිනිවුස්, දිනමිණ සහ තිනකරන් යන පුවත්පත්වල 2002.10.07 වන දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% වන පළාත් අධිකාරි බද්ද (සියයට එකක්), 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : සහකාර සාමාන්‍යාධිකාරී (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දු. ක. 011-2456285, 2456263, 2456284

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 011-2696155, 011 2572940

08-386

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වෙනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

බුලත්සිංහල, පරගොඩ පාර, පැරණි පොලිස් ස්ථානය ඉදිරිපිට ඩිලංකා සිනමා ශාලාව හි පතිරගේ ජයවර්ධන මහතා (මියගිය)

ණය යොමු අංකය : 5230551.

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2008.03.28 දිනැති අංක 1543 දරන *ගැසට් පත්‍රයේ* හා 2008.03.24 දිනැති ඩේලිනිවුස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ගාස්තු හා මුදල්ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදීම 2008.08.30 වැනි දින පෙ.ව. 11.00 ට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474, මහානාම ඩ්‍රයිව් හි පදිංචි වෙන්දේසිකාර රංජිත එස් මහානාම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර පස්දුන් කෝරළයේ, ගඟබොඩපත්තුවේ, බුලත්සිංහ හි පිහිටි 'තලන්කන්ද' නමැති ඉඩමේ සර්වේයර් ජනාරාල් විසින් සාදන ලද FVP140 හි විස්තර කළ බෙදන්ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : FVP 140 හි විස්තර කළ පාරද, නැගෙනහිරට : FVP140 සහ 1278 හි පාරද, දකුණට : ලොට් 1278 සහ ලොට් 1252 සහ FVP 140 හි විස්තර කළ පාරද, බස්නාහිරට : FVP 140 හි විස්තර කළ පාරද, මායිම්ව එකී අංක FVP 1251 දරන පිඹුරට අනුව අක්කර දෙකයි පර්චස් විසිඅටක (අ. 2, රූ. 0, පර්. 28) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO 22/25 හි ලියාපදිංචි කර ඇත.

ඉහත ලොට් 1251 වශයෙන් සඳහන් එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු පී. ඩී. ගුණසේකර විසින් සාදන ලද 1993 මැයි 29 දිනැති අංක 604 දරන මෑත මිණුම් පිඹුරේ පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

එකී බුලත්සිංහල ග්‍රාමයේ පිහිටි තලන්කන්ද නමැති ඉඩම එකී අංක 604 දරන පිඹුරේ විස්තර කළ ලොට් 1251 වශයෙන් සඳහන් බෙදනලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : FVP140 හි ලොට් 1250 (පාර) ද, නැගෙනහිරට : FVP 1278 හි ලොට් 1250 සහ 1278 ද, දකුණට : 140 හි ලොට් FVP 1278, 1252 සහ 1250 (පාර) ද, බස්නාහිරට : FVP 140 හි ලොට් 1250 (පාර) ද, මායිම්ව එකී අංක 604 දරන පිඹුර අනුව අක්කර දෙකයි පර්චස් විසිඅටක (අ. 2, රූ. 0, පර්. 28) බිම් ප්‍රමාණය සමග ගහකොළ වැවිලි ගොඩනැගිලි සහ වැවෙන සියලු දේ වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කළමනාකරු.

ලංකා බැංකුව,
බුලත්සිංහල ශාඛාව - 673

08-404

---

## මහජන බැංකුව - නිට්ටඹුව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

නිට්ටඹුව, මීගමුව පාර, අමුහේන, අංක 290 හි පදිංචියට සුදුසු පරිසරයක පිහිටි නිවසක් සහිත රූඩ් එකයි පර්චස් දහයයි දශම එකයි තුන (අ. 0, රූ.1 0, පර්. 10.13) ක ඉඩම මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2008.08.29 වන දින පෙ.ව. 10.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපල පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 1999.11.05 දිනද ඩේලිනිවුස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත් වල 2004.10.18 දිනද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම*.- නිට්ටඹුවේ සිට වේයන්ගොඩ පාරේ කි. මී. 1 ක් පමණ යන විට වම් පසට ඇති කෝලවත්ත පළමු පටුමඟ හමුවීමට පෙර වම්පසට ඇති පාරේ මී. 500 ක් පමණ ගියවිට වම්පසට හමුවන අතුරු පාරේ මී. 100 ක් පමණ යන විට මෙම සුරැකුම් දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැනුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පලාත් අධිකාරියට 1% ක් ,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත මුදුන්ගොඩ, බැලුම්මහර, නුවර පාර, අංක 131, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකාර වෙත ගෙවිය යුතුය.

දුරකථන : 033- 2222325, 033-2226741
ෆැක්ස් අංක 033-2226165

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක් මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් තක්සේරු සහ බ්‍රෝකර්
සාමදාන විනිශ්චයකාර (මුළු දිවයිනටම).

අංක 11/55,
කුඩා බුත්ගමුව,
අංගොඩ.
දුරකථන : 077-4372293
අංක 011-5756356

අංක 25 බී, බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 011-5756356

08-383

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී - මහරගම ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. සේනානායක විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියා සහතික කරන ලද්දා වූ 2004.12.30 දිනැති සහ අංක 1342 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම , දවුලගල මුරුතැන්ගේගෙදර තුෂාර සම්පත් තිරෝෂන ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2008 ක් වූ අගෝස්තු මස 27 වන දින ප.ව. 2.00ට ඇරඹෙන පරිදි දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, මහරගම, නගර සභා සීමාවේ, දෙපානම ගමේ, දෙපානම පන්නිපිටියෙහි පිහිටි වීර මාවතේ, වරිපනම් අංක 190/53 බී හි ගොඩැල්ල වත්ත දරන ඉඩමට බලයලත් මානක එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද 2001.02.28 දිනැති අංක 2995 ඒ දරන පිඹුරේ ලොට් අංක 'සී' ලෙස සලකුණු කරන ලද ඉඩම් කොටස සහ තවද 1342 දරන උකස් බැදුම්කරයේ දෙවන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතියද සමග වේ.

විශාලත්වය පර්චස් 7.25 යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.11.30 දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2007.12.05 වන දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක්ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියයි (රු. 500) ක් ද,
5. සියලුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2000) ක් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුලත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අදාල ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අයකිරීම) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479 ටී. බී. ජායා මාවත කොළඹ 10 දුරකථන අංක 2661826/2661816 ගෙන් ලබාගත හැක.

රංජිත එස් මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩුයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ,
දුරකථන අංක : 2863121.

08-391/2

---

**මහජන බැංකුව මහරගම ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන පනතේ 29 ඩී වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ, නාවින්න, යන ගම පිහිටි 'ගොරකගහවත්ත' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඒ. ජයරත්න මහතා විසින් 2000.03.30 වන දින මැන සාදන ලද අංක 2728 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කල ලොට් අංක F3B දරන කොටසට මායිම්, උතුරට : ලොට් F3A ද නැගෙනහිරට : ලැපත් සහ තවත් අය හිමිකම් කියන ඉඩමද, දකුණට : ලොට් F5 ද බස්නාහිරට : ලොට් F4 සහ F3C ද, යන මෙකී තුළ වූ, පර්චස් අටයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 8.5) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේපල මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මවිසින් 2008.08.25 වැනි දින පෙ.ව. 10.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපල පිහිටි ස්ථානයේදී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2008.05.16 දින ද ඩේලිනිව්ස් පුවත්පත සහ දිනමිණ පුවත් පතේ 2008.06.25 වැනි දින පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම*.- මහරගම සිට හයිලෙවල් පාරේ, නුගේගොඩ දෙසට නාවින්න හන්දියට පැමිණ, දකුණු දෙසට ඇති දේවානන්ද මාවතේ මීටර් 150 ගිය පසු දකුණු පසට ඇති අඩි 10 ක් පළල පාරේ, මීටර් 20 ක් පමණ ගිය විට විකිණීමට ඇති දේපල හමුවේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසියේ අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය.

1. ගැනුම් මිලෙන් 10% ක් ,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක් ,
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණු මිලෙන් 02 1/2 ක්,
4. ලිපිකරු සහ නිවේදක ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත නුගේගොඩ ස්ටැන්ලි තිලකරත්න මාවතේ, අංක 102 හි, මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කළමනාකරුට (කොළඹ පිටත) ගෙවිය යුතුය. දුරකථන අංක 2854189, 2811007 ෆැක්ස් 2768018 හිමිකම් ඔප්පු හා වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් මුදල දින 30 ක් ඇතුළත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු) වෙන්දේසිකරු, උසාවි කොමසාරිස්,
තක්සේරුකරු, භාෂා පරිවර්තක.

අංක 03,
පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථන අංක : 2810145, 0777-212602

08-392

---

**සම්පත් බැංකුව පී. එල්. සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ විකුණුම් නිවේදනයයි

ඊ. එම්. ඩී. යූ. බී. ඒකනායක - ගිණුම් අංක : 0007 5009 8533

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.07.26 වැනි දින යෝජනා කොට සම්මත කරගනු ලැබ 2002.02.09 වැනි දින රජයේ ගැසට් පත්‍රයේද 2007.01.29 වන දින දිනමිණ, ඩේලිනිව්ස්, සහ තිනකරන් යන දිනපතා පුවත්පත්වලද පළකරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දසලක්ෂ හැත්තෑ එක් දහසක (රු. 1,071,000) ක් මුදල සමග තවත් රුපියල් දසලක්ෂ හැටදහසක (රු. 1,060,000) ක් මුදල සඳහා වසරකට සියයට දාහතයි දශම පහ (17.5%) බැගින් 2006 පෙබරවාරි මස 02 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදලද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් 2008.08.29 වන දින පෙ. ව. 11.00 ට දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

මධ්‍ය පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර මැද පළාත කෝරළේ, යටිනුවර ප්‍රාදේශීය සභා සීමාව ඇතුලත ඉලුක්වත්තේ පිහිටි මාරලන්ගොඩ වත්ත (නිරිත දිග කොටස) නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු කේ. බී. ලන්සකාරනායක විසින් සාදන ලද 1989 සැප්තැම්බර් 14 දාතම හා අංක 147 දරන (2004 දෙසැම්බර් 22 වන දින පිටසන යොදා සහතික කළ) පිඹුරේ ලොට් 01 වශයෙන් ලකුණු කොට නිරූපිත, මහනුවර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව B 445/73 හි ලියාපදිංචි කළ ඊසානදෙසින් කොළඹ - මහනුවර මාර්ගයේ සිට ලගමුව දක්වා දිවෙන පාර ද, ගිනිකොණ දෙසින් කාණුව සහ එම ඉඩමේම ඉතිරි කොටසද, නිරිත දෙසින් පංසල් වත්තේ කන්දද සහ වයඹ දෙසින් ජීව් වැට සහ මාරලන්ගොඩ වත්තද මායිම් වන ප්‍රමාණයෙන් අක්කර එකක් (අක්. 1 , රූඩ් 0, පර්. 0) බෙදා වෙන්කොට සීමා නිර්ණය කල සම්පූර්ණ ඉඩම එහි පිහිටි සැම සියළු දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

08-400/10

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.